සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2020(I)**

| | | |
|---|---|---|
| කාලය: පැය 03 | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය- 04 | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>........................................ |

- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. i. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ගේ හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ අන්තර්ගත කර ඇති පරිදි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පාලනය ක්‍රියාත්මක වන ආකාරය අදාළ ව්‍යවස්ථාපිත නියමයන් සහිතව විස්තර කරන්න. (ලකුණු 15)

    ii. යම්කිසි වර්ෂයක අදාළ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවනු ලැබුවේ නම් රජයේ සේවාවන් හා මැතිවරණය සඳහා මුදල් ලබා ගන්නා ආකාරය ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

02. i. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ වර්ගීකරණය හා MNPEA/PLN/PL/2019 දරන 2019.01.10 දිනැති චක්‍රලේඛයේ කර ඇති වර්ගීකරණය අනුව තිබෙන ප්‍රධාන ව්‍යාපෘති වර්ග පහක් (05) නම් කරන්න. (ලකුණු 05)

    ii. මුදල් රෙගුලාසි 03 හි සඳහන් පරිදි ව්‍යාපෘති සැලසුම් කිරීමේ අදියරයන් නම් කරන්න. (ලකුණු 10)

    iii. වර්ධනාත්මක අයවැයකරණය (Incremental Budgeting) සහ ශුන්‍යපාදක අයවැයකරණය (Zero-based Budgeting) අතර වෙනස්කම් දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. i. මුදල් රෙගුලාසි 135 යටතේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් කාර්යයන් පැවරීමේ දී ගණන්දීමේ නිලධාරීන් විසින් තම යටත් නිලධාරීන්ට ආදායම් හා වියදම් සම්බන්ධයෙන් එසේ පවරා දෙනු ලබන කාර්යයන් නම් කරන්න. (ලකුණු 07)

    ii. මුදල් රෙගුලාසි “137 අනුමත කිරීම“ යටතේ යම් වියදමක් අනුමත කරන නිලධාරියාගේ වගකීම් හතරක් (04) නම් කරන්න. (ලකුණු 08)

    iii. මුදල් රෙගුලාසි 143(2) යටතේ ආදායම් එකතු කරන නිලධාරියාගේ වගකීම් පහක් (05) දක්වන්න. (ලකුණු 05)

04. i. මුදල් රෙගුලාසි 126 ට අනුව භාණ්ඩාගාරයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ රජයේ මුදල් පිළිබඳ පාලනය හා අධීක්ෂණය පවත්වාගෙන යාමයි. මෙම භාණ්ඩාගාරයේ පාලන හා අධීක්ෂණ කාර්යයට අයත් කරුණු පහක් (05) දක්වන්න. (ලකුණු 05)

ii. මුදල් රෙගුලාසි 128 ට අනුව ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම් පහක් (05) දක්වන්න. (ලකුණු 05)

iii. රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 10)

05. i. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක වගකීම් හා කාර්යයන් හතරක් (04) නම් කරන්න. (ලකුණු 08)

ii. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ලංසු විවෘත කිරීමේ කමිටුවේ කාර්යයන් සහ වගකීම් තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී භාවිත කරනු ලබන ඇපකරයන් වර්ග තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. පහත සඳහන් කරුණු පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. බැංකු සැසැඳුම් ප්‍රකාශය

ii. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

iii. හානි පාඩු පිළිබඳ පූර්ණ වාර්තාවක අඩංගු කරුණු

iv. හානි රක්ෂණ බැඳුම්කරය

(ලකුණු 5 x 4 = 20)

*************